**කොළඹ විශ්වවිද්‍යාලය - 2019**

**----------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

කොළඹ විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පවරා ඇති 1980 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකගේ වගකීම**

---------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කර මාස 05 සිට මාස 11 ක් ගත වී තිබූ ව්‍යාපෘති 05 ක එකතු වටිනාකම රු. 19,627,090 ක් තවදුරටත් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබූ අතර ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු.13,554,963 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය නිමා වී ඇති බවට වැඩ නිම වීමේ සහතිකය ගිණුම් අංශයට ලැබී නොතිබූ බැවින් කෙරීගෙන යන වැඩ ගිණුමේ රඳවා ඇති අතර කොන්ත්‍රාත් ප්‍රදාන වටිනාකම හා 2019 දෙසැම්බර් 31 දිනට දරා ඇති පිරිවැය අතර වෙනස ගෙවිය යුතු ගිණුම්ගත නොකළ ශේෂය ලෙස එකඟ නොවේ. | වැඩ අවසන් වූ ව්‍යාපෘති හා දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කළයුතු එකතුව රු. 10,310,841 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වසරේ ඌනතාවය හා ගොඩනැගිලි වටිනාකම පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙම ව්‍යාපෘති දෙකෙහි වියදමේ ස්වරූපය අනුව ප්‍රාග්ධන වියදමක් නොවන අතර අයභාර ස්වරූපයේ වියදමකි. | පුනරාවර්තන හා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් නිවැරදිව හඳුනගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයට අදාළ ක්ෂය වියදම සහ වර්ෂයේ ඌනතාවය රු.1,344,012 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2020 වර්ෂයේ දී නිවැරදි කරනු ලැබේ. | ස්ථාවර වත්කම් නිවැරදි වර්ගීකරණය යටතේ ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන අනුව විලම්භිත පාඨමාලා ආදායම අදාල උපලේඛන සමඟ සැසඳීමේ දී රු. 14,565,700 ක නොසැසඳීමක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම විගණනයට පැහැදිලි නොකෙරුණි. | ආදායම රු. 14,565,700 ක් වැඩියෙන් ගිණුම්ගත කර ඇති බව පිළිගනිමි. | ලෙජර් ගිණුම් හා උපලේඛන සසඳා නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ඉ) | විගණනයේ ගණනය කිරීම් අනුව 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන පොලී ආදායම රු. 237,168,553 ක් විය යුතු වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එම ශේෂය රු. 237,943,303 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම රු. 774,750 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම වැඩියෙන් ගිණුම්ගත වී ඇති බව පිළිගනිමි.2020 ගිණුම් සකස් කිරීමේ දී අදාල නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ. | වර්ෂයට අදාළ පොලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරින් 33 දෙනෙකු වෙත ලබා දී තිබූ වසර 01 සිට වසර 32 දක්වා පැරණි එකතුව රු.931,255 ක ණය ශේෂ අය වී නොතිබුණි. | එක් පුද්ගලයා සඳහා සිහිකැඳවීම් යොමු කිරීම, අර්ථසාධක අරමුදල් මඟින් ලබාගැනීම සඳහා ලිපි යොමු කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන ඇත. | ණය මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 | විශ්වවිද්‍යාලයේ කාර්යාල ඇතුලු ඒකක 05 ක වර්ග 14 කට අයත් ඒකක 52 ක භාණ්ඩ අස්ථානගතව ඇති බවට 2018 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් අනාවරණය කර තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | උද්‍යාන පාලන අංශයේ සිදු වූ අයිතම 26 ක සොරකම සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ලියාහැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 26 වගන්තිය | ශ්‍රීපාලි මණ්ඩපය නමින් කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධව මණ්ඩපයක් පිහිටවනු ලැබුවද යථෝක්ත වගන්තිය ප්‍රකාරව නියමයන් සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | ශ්‍රීපාලි මණ්ඩපය සඳහා වෙනම නියමාවලියක් නොමැති නමුත් 1995.11.07 නිකුත් කරන ලද විශේෂ ගැසට් පත්‍රයකින් විශේෂ නියමාවලියක් මගින් මණ්ඩප සභාවේ සංයුතිය ලබාගෙන ඇත. | පනතෙහි සඳහන් පරිදි නියමාවලියක් සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |
| (ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය | | | |
| (i) XII පරිච්ඡේදයේ 2.1.3 වගන්තිය | විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු හෝ නිලධාරියෙකු උපාධි අපේක්ෂකයෙකු වූ කල්හි ඒ පරීක්ෂණය සඳහා විශ්වවිද්‍යාලයේ නිළධාරියෙකු හෝ ආචාර්යවරයෙකු පරීක්ෂකයෙකු වශයෙන් පත් නොවිය යුතු නමුත් 2016 - 2019 කාලපරාසය තුළ අධ්‍යාපන පීඨය මගින් පවත්වා තිබූ පූර්ණ කාලීන පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා අධ්‍යයන නිවාඩු රහිතව එම පීඨයේම ආචාර්යවරු 10 දෙනෙකු සහභාගි වී තිබුණි. | පීඨයෙහි පවතින කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් පීඨ කාර්ය මණ්ඩලයට විශ්වවිද්‍යාල සේවයෙහි නිරතවන අතරතුර පාඨමාලාව හැදෑරීමට උසස් උපාධි කමිටුව සහ පීඨ මණ්ඩලය විසින් අවසර දෙන ලදී. ඔවුන්ගේ සේවය පීඨයට ලබා ගැනීම මෙම අවසර ලබා දීමෙහි අරමුණ විය. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) XXII පරිච්ඡේදයේ 11.1 | විනය පරීක්ෂණ මගින් අවසන් තීරණයකට එළඹෙන තුරු හැකිතාක් දුරට නොකඩවා රැස් වී මාස 03 ක් ඇතුළත දී පරීක්ෂණය අවසන් කළ යුතු වුවත් නිලධාරීන් දෙදෙනෙකුගේ විනය පරීක්ෂණ දෙකක් සඳහා අවුරුදු 3 ½ කට අධික කාලයක් ගත වීම හේතුවෙන් එම කාලය තුළ සේවය ලබාගැනීමකින් තොරව අඩ වැටුප් ලෙස රු.8,688,863 ක් ගෙවා තිබුණි. එසේම අදාල පරීක්ෂණ මෙහෙයවීම සඳහා නීතිඥවරු සහ පරීක්ෂණ නිලධාරීන් වෙනුවෙන් රු.5,325,750 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | පාලක සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම ඇතුළුව විවිධ හේතු මත විනය පරීක්ෂණ ප්‍රමාදවීම සිදුවිය. විනය පරීක්ෂණවල කටයුතු හැකි ඉක්මනින් අවසන් කිරීමට විශ්වවිද්‍යාලය විසින් සියලු කටයුතු සිදුකර ඇති බව හා ආයතන සංග්‍රහයෙහි දක්වා ඇති පරිදි හැකි ඉක්මනින් සහ කිසිදු පාර්ශවයකට අගතියක් සිදු නොවන පරිදි පරීක්ෂණ කටයුතු සිදු කර ඇති බවත් ප්‍රකාශ කර සිටිමි. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) II කොටසෙහි 33 පරිච්ඡේදය | ලේඛකාධිකාරිවරයෙකු ඇතුලු ආචාර්යවරු 16 දෙනෙකු විසින් අධ්‍යයන පාඨමාලා, ආචාර්ය හා පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම වෙනුවෙන් මාස 06 සිට අවුරුදු 03 ක් දක්වා කාලපරිච්ඡේදයක් වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගෙන තිබුණද අදාල පාඨමාලාවන් සම්පූර්ණ කර නොතිබුණි. ගිවිසුම් කඩ කිරීම මත ඔවුන්ගෙන් අයවිය යුතු එකතුව රු.39,991,773 ක ඇප බැඳුම්කර අයකර ගෙන නොතිබුණි. එමෙන්ම ඉහත ආචාර්යවරු 05 දෙනෙකු වෙත විවිධ ව්‍යාපෘති සහ අධ්‍යනාංශ මඟින් එකතුව රු.3,923,588 ක මූල්‍යාධාර ලබා දී තිබුණද එම මුදල් ද ආපසු අයකර ගෙන නොතිබුණි. | මෙයින් ආචාර්යවරු 09 දෙනෙකු 2020 වර්ෂය තුළදී ආචාර්ය උපාධිය සම්පූර්ණ කර ඇති අතර 06 දෙනෙකුගේ ආචාර්ය උපාධියේ නිබන්ධන කටයුතු සිදුකෙරෙමින් පවතී.එක් අයෙකුගෙන් අයකර ගත යුතු රු.788,008 සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකිරීම විශ්වවිද්‍යාලයට ඵලදායී නොවන බව පාලක සභාව තීරණය කර ඇති අතර අනෙකුත් ආචාර්යවරුන්ගෙන් වාරික ලෙස මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 2 ඡේදය | ආයතනයක සියලු ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් පිරිවැය ආවරණය වන පරිදි (Cost recovery) සහ ලාභ නොලබන පරිදි (Nonprofit Basis) විය යුතු වුවද ව්‍යාපෘති හා පාඨමාලා 08 ක ආදායම ඉක්මවා එකතුව රු.2,427,377 ක වියදමක් දරා තිබීම හා අවසන් වී තිබූ පාඨමාලා 15 ක එකතුව රු.15,337,834 ක අතිරික්ත මුදල් වසර 01 සිට වසර 07 අතර කාලයක් තුළ නිෂ්කාර්යව තිබුණු බව නිරීක්ෂණය විය. | ඉංග්‍රීසි පාඨමාලා යටතේ දක්වා ඇති රු.947,565 වූ අගය 2020 වර්ෂයේදී නිවැරදි කර ඇති අතර අනෙකුත් පාඨමාලා ශේෂයන්ගේ එකතුව රු.15,337,834 ක අගය 2020 වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) 1996 ජුනි 20 දිනැති අංක 928/1 දරන ගැසට් නිවේදනය | ශ්‍රීපාලි මණ්ඩපය සඳහා අධ්‍යයන පීඨ 02 ක් පිහිටුවීමකින් තොරව අධ්‍යනාංශ 02 ක් සඳහා උපාධි අපේක්ෂකයින් බඳවාගෙන තිබුණි. | පීඨ පිහිටුවීමට අදාළ යෝජනාවලිය සකස් කර අනුමැතිය ලබාගැනීමට සනාතන සභාව සහ පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇත.එහෙත් මානව සම්පත් හා භෞතික සම්පත් ඌනතාවය හේතු කොටගෙන සනාතන සභාව විසින් එම යෝජනාවලිය නිර්දේශ කර නොමැත. | ගැසට් නිවේදනය නිකුත්කර වසර 24 ක් ගත වී ඇති බැවින් අධ්‍යයන පීඨ කඩිනමින් පිහිටුවීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.696,404,210 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 283,376,914 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.979,781,124 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීමේ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශාස්ත්‍ර පීඨයේ සිංහල හා සමාජවිද්‍යා දෙපාර්තමේන්තු යටතේ පවත්වාගෙන යනු ලබන පුස්තකාල මඟින් ආචාර්යවරුන් බැහැරට ගෙන යන ලද පොත් 77 ක් වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලපරාසයක් තුළ ආපසු භාර දී නොතිබුණු අතර අස්ථානගත වී තිබූ පොත් 186 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පොත් 186 ක් සම්බන්ධව කරනු ලබන පරීක්ෂණයේ ප්‍රතිඵල ඉතා ඉක්මනින් ලබාදීමට කටයුතු කරන බවට ප්‍රජා විද්‍යා දෙපාර්තමේන්තු අංශ ප්‍රධානීන් විසින් දන්වා තිබේ. | පොත් බැහැර ගෙන යාම සම්බන්ධව පවත්නා පද්ධතිය වැඩිදියුණු කළ යුතු අතර අස්ථානගත වී ඇති පොත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රීපාලි මණ්ඩපයේ අධ්‍යාපනය ලබන සිසුන් වෙනුවෙන් පවතින දේශන ශාලා භාවිතයට සුදුසු තත්ත්වයේ නොපැවැතීම, රංග ශාලාව සඳහා අත්‍යාවශ්‍ය භෞතික පහසුකම් ලබා දී නොතිබීම, අභ්‍යන්තර මාර්ග පද්ධතිය අබලන්ව පැවතීම, ගුණාත්මක අධ්‍යාපන පරිචයන් සඳහා අවශ්‍ය වන ශබ්ධාගාර, චිත්‍රපට චිත්‍රාගාර , ශ්‍රව්‍ය දෘශ්‍ය චිත්‍රාගාර, පෙර පුහුණු ශාලා සහ ශිෂ්‍ය නේවාසිකාගාර ප්‍රමාණවත් නොවීම නිරීක්ෂණය විය. | මණ්ඩපය තුළ පවතින පැරණි ගොඩනැගිලි සඳහා නිරන්තර නඩත්තු කටයුතු සිදුකිරීම අවශ්‍ය වන අතර ශිෂ්‍ය කටයුතු සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමට යෝජනාවලියක් සකස් කරමින් පවතී. නේවාසික පහසුකම් ලැබීමට සුදුසු පිරිමි සිසුන් සඳහා රු.3,500 ක මාසික ශිෂ්‍යාධාරයක් ගෙවා ඇත. | අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයට සහ භෞතික සම්පත් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් වටිනාකම රු.272,915,895 ක් වූ කළමනාකරණ සහ මූල්‍ය අධ්‍යයන පීඨයේ බටහිර අන්තයේ ගොඩනැගිල්ල (West Wing Building) ප්‍රසාරණය කිරීමේ ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව 2019 අගෝස්තු 22 දින වැඩ අවසන් බවට සහතිකය ලබා දී තිබුණද එදිනට ව්‍යාපෘති කළමනාකරණ කමිටු වාර්තාව අනුව මූලික කොන්ත්‍රාත්තුවේ ඇතුළත් ප්‍රධාන අයිතම තුනක් සම්පූර්ණ කර නොතිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීම 2020 ජනවාරි 29 දින දක්වා දින 130 කින් ප්‍රමාද වී තිබූ අතර ඒ වෙනුවෙන් අයකල යුතු රු.15,425,670 ක ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව කටයුතු කිරීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබාගැනීමට අපේක්ෂිත ශිෂ්‍යයින් බහුතරයක් සිටියදී විශ්වවිද්‍යාලයේ පීඨයන් 06 ක 2019 වර්ෂය සඳහා බඳවාගත හැකි ශිෂ්‍ය ධාරිතාවයට වඩා ශිෂ්‍යයින් 01 සිට 12 දක්වා ප්‍රමාණයකින් අඩුවෙන් බඳවා ගැනීම හේතුවෙන් ශිෂ්‍යයින් 31 දෙනෙකුට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි. | විශ්වවිද්‍යාලයේ සියලුම පාඨමාලා සඳහා සිසුන් තෝරා එවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. එම සිසුන් සියල්ලම ලියාපදිංචි නොවන අතර මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා ඇත. | අවශ්‍ය සම්බන්ධීකරණය සහ පසුවිපරම් කටයුතු කාලීනව සිදුකර පවත්නා ශිෂ්‍ය ධාරිතාවයට බඳවා ගැනීම් සිදුකළ යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට අරමුදල් 33 ක එකතුව රු. 91,410,534 ක ශේෂයක් පැවතියද අදාල අරමුදල් මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | අරමුදල් 33 ක ඇති රු.112,410,534 ශේෂය ඉදිරි වසර වලදී උපයෝගී කර ගැනීමට කටයුතු කරනු ඇත. | අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | ශ්‍රීපාලි මණ්ඩපය සඳහා මූල්‍ය ස්වාධීනත්වයක් නොතිබීම නිසා එහි කාර්යයන් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මුදල් කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වීමෙන් මෙහෙයුම් කාර්යක්ෂමතාවය අඩු වී තිබීම නිරීක්ෂණය විය.තවද 2015 – 2018 කාලපරාසය සඳහා විශ්වවිද්‍යාලය විසින් ශ්‍රීපාලි මණ්ඩපය වෙනුවෙන් සිදු කරන ලද ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් වලින් සියයට 89 සිට සියයට 96 දක්වා පරාසයක් තුළ ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණද සියයට 66 සිට සියයට 83 දක්වා පරාසයක ප්‍රතිපාදන මුදල් පමණක් නිදහස් කර තිබුණි. | භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන ලබාදීමේ දී වැටුප් හා වේතන සඳහා සියයට 100 ක් ප්‍රතිපාදන ලබා දුන්නද,අනෙකුත් පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා ප්‍රතිපාදන සියයට සියයක් ලබා නොදේ. | මූල්‍ය කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රීපාලි මණ්ඩපය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 163 ක් හා සත්‍ය කාර්ය මණ්ඩලය 128 ක් වූයෙන් පුරප්පාඩු 35 ක් විය. එම පුරප්පාඩු තුළ වූ කළමනාකාරිත්වයේ ප්‍රධාන තනතුරු සම්පූර්ණ නොකිරීමෙන් පරිපාලන කටයුතු විධිමත් නොවීම නිරීක්ෂණය විය. | 2020 ඔක්තෝම්බර් 20 වන දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු 31 ක් පවතින අතර ඊට මහාචාර්ය තනතුරක් , තාවකාලික සහය කථිකාචාර්ය තනතුරු 04 ක් , තාවකාලික කථිකාචාර්ය තනතුරු 02 ක් ඇතුළත්ය. විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ 2019 නොවැම්බර් 26 දිනැති අංක **HE/EST/01/0/UGC III** ලිපිය මඟින් සියලුම අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත. | අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම් කඩිනම් කර කාර්යක්ෂමතාවය වැඩිදියුණු කළ යුතුය. |